



## වැස්ස

අහසත් කළු කරගෙන එන් නේ
වැහි බිඳු මිහි මත විසිරෙන් නේ
වැහි කුරුල්ලො හඬ නංවන් නේ
වැස්සක් එනබව අපට හැඟෙන් නේ

මහ වැසි පොළවට වස්සන් නේ
ගෙම්බා බක බක ගානද දෙන් නේ
කොළයක් අරගෙනඹරුව හදන් නේ
පාවී යනු දැක සතුට දැනෙන් නේ

♦ *අයි. වී. ඕෂධී වදිපනී*
හීනටිගල ශාරිපුත්‍ර ම.වි.
ගාල්ල Sri Lanka

## විදු මවට

ඉර නැග බැස යන යාමෙට
නෙත ඉදිකඩ රඳවාගෙන
මා නෙත දුටු අනාගතය
සිහින මවා මා සැනසූ
මට අමතක නෑ ඔබේ
පැතුම් සිතුම් වැල්
නෙතු නොනිදා වනපොත් කළ
එකොලොස් වසරක ප්‍රේමය

♦ *ජේ. එම්. අසෙනි වාසනා*
කීර්ති බණ්ඩාර මහ විදුහල
කුඹල්ගමුව Sri Lanka

## දවසක ඇරඹුම

නැගණහිරින් හිරු පායා
මුළු ලෝකය එළිය කරන්නා
පිනි බිඳු මල් උඩ වැටිලා
මුළු ලෝකය සුවඳ කරන්නා
මිනිසුන් විකසිත වීලා
මුළු ලෝකය කඩිසර වෙන්නා
සුන්දර මේ උදෑසනේ
මුළු ලෝකය පිබිදී යන්නා

♦ *උපේන්ද්‍රා චාමිණී විතාන*
රාජසිංහ මහ විදුහල
හංවැල්ල Sri Lanka

## Vaccines එන්නත් කිරීම

The principles of vaccination had been understood at least partially in China many centuries before Edward Jenner (1749-1823) experimented with a smallpox vaccine. The Chinese discovered that, if they blew the powdered scab of a smallpox victim up the nose of someone who hadn't had the disease, then he would acquire some immunity. Jenner found that cowpox victims were unlikely to catch smallpox, so he deliberately injected a boy with cowpox. A few months later, the boy was found to be immune to smallpox. Other vaccines were later developed which wiped out many highly infectious and debilitating diseases, such as tuberculosis, and polio.

එන්නත් කිරීම හෙවත් බෝවන රෝග සඳහා බෙහෙත් විදීම සොයා ගත්තේ එඩ්වර්ඩ් ජෙනර් වුවද ඊට ශත වර්ෂ ගණනාවකට පෙර සිට වසූරි රෝගියෙකුගේ තුවාලයේ වියලි කබොල්ලක් කුඩුකර නිරෝගී කෙනෙකුට නාසය තුළට පිම්බ විට ඒ තැනැත්තාට වසූරිරෝග ඹර්දන ප්‍රතිශක්තිය ලැබෙන බව චීන ජාතිකයෝ දැන සිටියහ. ජෙනර් වසූරිය වැළඳුණු ගවයෙකුගේ විෂබීජ උවමනාවෙන්ම නිරෝගී ළමයෙකුට එන්නත් කළේය. මාස කීපයකට පසු ළමයාට මිනිස් වසූරිය වැළඳුනේ නැති බවත්, ඔහුට වසූරි මර්දනන ප්‍රතිශක්තිය ලැබී ඇති බවත් ඔප්පු විය. ඉන් පසු ක්ෂය රෝගය වැනි වෙනත් බෝවන රෝග හා පෝලියෝ මර්දනය සඳහාද බෙහෙත් එන්නත් කිරීම ආරම්භ විය.

♦ *Auntie Ramani ( රමණී නැන්දා )*

## How Lucky We Are!

♦ **Alana**
**Derbishire UK**

The sun the stars
Jupiter Mars
that really bright
rainbow with a pot of gold
or so I've been told
what is the world without the butterflies
the blue sky
daisies to make a chain
to water the plants there is rain
so think what it would be like
shut your eyes tight
and realize how lucky we are



BOC
ලංකා බැංකුව
BANK OF CEYLON
ඔබට විශ්වාස තැබිය හැකි බැංකුවයි
ලන්ඩන් ශාඛාව

**ඔබේ මුදල් ගාස්තුවකින් තොරව සුරක්ෂිතව හා විශ්වාසදායකව ශ්‍රීලංකාවට ප්‍රේෂණයකිරීමේ මහඟු අවස්ථාවක් !**

* ලංකා බැංකුවේ ලන්ඩන් ශාඛාව මගින් ශ්‍රීලංකාවේ ලංකා බැංකු ශාඛාවන්හි පවත්වාගෙන යනු ලබන ඕනෑම ගිණුමකට ඔබත් ගාස්තුවකින් තොරව මුදල් ප්‍රේෂණය කරන්න.

* ඔබගේ ඉතුරුම් වෙනුවෙන් ලංකා බැංකුවේ අනේවාසික විදේශ ගිණුමක් (NRFC) ආරම්භකර පවුම් වලින් මුදල් ප්‍රේෂණය කර පහත සඳහන් ප්‍රතිලාභ ලබාගන්න.

1. පවුම් වලින්ම පොළිය ලබාගැනීම.
2. ගිණුමේ ඇති මුදල් නිදහසේ ඕනෑම අයෙකුට හෝ විදේශ රටක ඇති ගිණුමකට ප්‍රේෂණය කිරීමේ හැකියාව.
3. NRFC ගිණුම මාර්ගයෙන් මුදල් ප්‍රේෂණය කිරීමෙන් උපරිම විනිමය අනුපාතිකයක් රුපියල් සඳහා ලබාගැනීමේ හැකියාව.

*ලංකා බැංකුවට පැමිණීමෙන් හෝ* **HSBC, NATWEST, BARCLAYS** *බැංකු වලින් අපගේ පහත සඳහන් රැස්කිරීමේ ගිණුම්වලට මුදල් බැර කිරීමෙන් අනතුරුව අපව අමතන්න.*

HSBC - Sort Code : 40 - 05 - 15 A/C - 00491624
NatWest - Sort Code : 60 - 00 - 04 A/C - 04607732
BARCLAYS - Sort Code : 20 - 32 - 53 A/C - 80113859

**No 1, Devonshire Square, London EC2M 4WD**
**Phone : 020 7377 1888 Fax: 020 7377 5430**
e-mail : bankofceylon.uk@btclick.com
Our Web - www.boc.lk
Nearest railway station - Liverpool Street (tube & rail) Bishop Gate Exit



*ජනාධිපතිවරයා පිහිනුම් ශූරී ඕෂධී දැරිය සමග*

# 5 හැවිරිදි දැරියක් කැළණි ගඟ හරහා පීනයි

ජනවාරි 30 දින උදයේ පස් හැවිරිදි දැරියක් කැළණි ගඟේ මීටර් 100 ක් පළල ස්ථානයකදී බලා සිටින සියල්ලන් මවිතයට පත්කරමින් ගඟ හරහා අනෙක් ඉවුරට පීනුවා ය. මෙම විස්මය ජනක දස්කම පෑවේ වැල්ලම්පිටියේ, සේදවත්තේ, ව්‍යාමා ඕෂධී නම් දැරියයි. මෙය නරඹන්නට එදින උදෑසන කැළණි ගඟ අසබඩට විශාල ජනකායක් රැස්ව සිටියහ.

මෙම දැරිය සේදවත්තේ ගං ඉවුරේ සිට පිහිනුම පටන් ගනිද්දී ක්‍රීඩා පිළිබඳ වෛද්‍ය අයතනයේ පුහුණු කරුවන් වන රනිල් පණ්ඩිතරත්න සහ උඩුගම යන මහත්වරු එය නිරීක්ෂණය කිරීමට එහි පැමිණ සිටියෝ ය. ඕෂධී මෙම දුර අවසන් කරන්නට විනාඩි 14 කුත් තත්පර 41 ක් ගත් අතර එවැනි වයසක කුඩා දැරියක් මෙවැනි දස්කමක් කරනු තමන් දුටු පළමුවන වතාව බව ඉහතකී පුහුණුකරුවෝ දෙදෙන ප්‍රකාශ කළහ. එසේම මෙම දස්කම ගිනස් වාර්තාවක් බවද කියැවේ. ලොව මේ වයසේ වෙනත් දැරියක් මේ සා දුරක් පිහිනා නැත.

ඕෂධී කොළඹ කාල්ටන් පෙර පාසැලේ ඉගෙනුම ලබන්නීය. ඇගේ බලාපොරොත්තුව නුදුරු දිනයක මුහුදේ ද මෙවැනි දුරක් පිහිනන්නටය. මෙය නරඹන්නට පැමිණ සිටි කොළඹ දිස්ත්‍රික් මන්ත්‍රී දුමින්ද සිල්වා මහතා දැරියට ලැප්ටොප් පරිගණකයක් තෑගි කළේ ය.

# අම්මා ගැන කෙටි සටහනක්!



ගිය දෙසැම්බර් මාසයේ අග මමද අපේ පවුලේ සියල්ලන්ද ලංකාවට ගියේ මගේ මියගිය සොහොයුරියගේ දියණියගේ විවා මංගල්‍යයටය. එම මංගලෝත්සවය වේයන්ගොඩ දී ඉතා ඉහළින් පැවැත්වූ අතර අපේ අම්මා එහි විශේෂ තැනක් ඉසිලුවා ය. තම මිනිබිරියගේ විවාහයට තම දියණියගේ අඩුව යාන්තමින් හෝ පුරවන්නට තමාට හැකිවීම ගැන ද අම්මා මා සමගත් අනෙක් අය සමගත් කීවේ කිසියම් සතුටකිනි.

එයින් දින කීපයකට පසු කිසිවෙකු යාන්තමින් වත් නොසිතූ ලෙස අම්මා හදිසියේම මෙලොවින් තුරන් වූවා ය. ඒ අවසාන මොහොතේ අපි කවුරුත් අම්මා වටේ සිටියෙමු. මගේ අම්මා ගැන ලියන්නට බොහෝ දේ ඇතත් ඒ සියල්ල ගලපා ගන්නට මට මේ මොහොතේ නොහැක. එනිසා ඉක්මනින් මේ කෙටි ලිපිය ලංකාවිත්තියට ලියා එවන්නට අදහස් කළෙමි.

අපේ අම්මා ඉපදුනේ **1923** වර්ෂයේ අගෝස්තු **18** වෙනිදා රත්නපුර දිස්ත්‍රික් කයේ කුරුගම්මෝදර ග්‍රාමයේ ය. අම්මාගේ පියා වූයේ නැසීගිය ඩබ්ලිව්. පී. යසවර්ධන නම් ඒ පළාතේ රිජිස්ටාර් රාළහාමි ය. මව වූයේ නැසීගිය කුඹුකගේ පොඩි නෝනා ය. ඇයගේ ගම කුරුවිටය. මගේ තාත්තා වග නම් ප්‍රදේශයේ කඩුගොඩ ග්‍රාමයේ විසූ ඩී. ඒ. කාරියවසම් නම් ආයුර්වේද වෛද්‍යවරයාය. එතුමාද අද ජීවතුන් අතර නැත.

දරුවන් **7** දෙනෙකුගෙන් යුත් පවුලේ වැඩිමලා වූයේ මාය. එබැවින් මා කුඩා කල සිටම අප පවුලේ හැඳින්වුණේ "**ලොකු ළමයා** " යන නාමයෙනි. කුඩා කල මා වැඩිපුර හැදුණේ වැඩුණේ ආත්තම්මාගේ නිවසේය. එහි නැන්දලාද සිටියෝය. ඒ මගේ තාත්තාගේ නිවසයි. මගේ මව විවාහකර ගැන්මෙන් පසු තාත්තා මහගෙදරින් බැහැරවීමේ පාළුව මකා ගැන්ම පිණිස මට එහි සිටින්නට සිදුවූයේ ආතම්මාගේ පෙරැත්තය නිසා ය. එහි වෙනසක් මට දැනුණේ නැත. එය මගේ ගෙදරම හා සමාන විය. ඒ මහගෙදර තිබුණේ වැඩි ඈතක නොවන නිසා දවසකට කීප වතාවක් මම එකඑක දේට ඒගෙවල් දෙක අතර දුව ගියෙමි. ගෙදර සාදන සෑම කෑම කින්ම අම්මා "**ලොකු ළමයාගේ** "පංගුව වෙන්කර තබා තිබුණාය. අම්මාගේ ආදරය මම හැම විටම සිහිපත් කළෙමි.

අම්මා සම්බන්ධ විශේෂ අවස්ථාවන් රැසක් මගේ මතකයේ පවතී. කුඩාවියේ සිට මේ දක්වාත් මම සව් බොරොච නම් ලංකාවේ සාදන ග්‍රාමීය විස්කෝතු වර්ගයට ආසා ඇත්තෙමි. මගේ අම්මා මේ බව හොඳින් දැන සිටියාය. වසර ගණනකට පෙර මා ලංකාව හැර දමා විදේශ ගතවන දිනයට දින දෙකකට පෙර අම්මා දකින්නට කඩුගොඩ ගෙදරට ගියෙමි. එදින මා යන නිසා අම්මා සිටියේ ඉතා දුකෙනි. අම්මා සමග කතා කරමින් සිටි ඒ මොහොතේ ගේ අසලින් යන ගමේ කඳාති ළමයෙකුට අම්මා අඬගැසුවාය. " ලොකු ළමයා කැමතියි නේද සව් බොරච කන්න? " මා කිසිවක් කියන්නට පෙරම අම්මා අර ගමේ ළමයාට මුදල් දී සව්බොරච කීපයක් ගෙනෙන්නට ඔහු පිටත් කළා ය. ඒ මොහොතේ මම ඇසට ඉනූ කඳුළු සඟවා ගන්නට වෑයම් කළෙමි. ඒ අපේ අම්මා ය.

අම්මා පුදුම ගතිගුණ ඇති කාන්තාවකි. තාත්තා නැතිවූ පසු ඒ අඩුව කිසි දරුවෙකුට දැනෙන්නට ඇය ඉඩ තැබුවේ නැත. අම්මා බොහෝ පින් දහම් කර ඇති කෙනෙකි. එසේම අම්මා දඹදිව වඳින්නට එක්කගෙන යන්නට මට හැකි වීම ගැන මම අද සතුටුවෙමි.

අම්මාට වයස **88** ක් වූ නමුදු ඒ අවසාන මොහොත දක්වා ජීවිතයේ කිසි දිනක කිසිවක් පොතක පතක කියවන්නට ඇය කණ්ණාඩි කුට්ටමක් පාවිච්චි කර නැත. ඇය දිනපතා නින්දට ගියේ බුදුන් වැඳ, දෙවියන්ට පින් දී, පිරිත් සජ්ජායනා කිරීමෙන් පසුව ය.

ජනවාරි 22 වන දිනයේ ද අම්මා නින්දට ගියේ එලෙසය. එහෙත් එදින මධ්‍යම රාත්‍රියේ හුස්ම ගන්නට අපහසු බව කී නිසා අපි වහා ඇය අවිස්සාවේල්ල රෝහලට ගෙන ගියෙමු. එහිදී පසුදා එනම් 23 වන ඉරිදා උදේ නමය හමාරට අම්මා නිසොල්මන්ව අවසන් වරට දෙනෙත් පියාගත්තාය. අම්මා මිය ගිය පසු ඇය කලින් කර තිබූ ඉල්ලීම පරිදි අපි ඇයගේ ඇස් පරිත්‍යාග කළෙමු.

පිටරට සිටින බොහෝ දරුවන්ට තම දෙමාපියන්ගේ අවසාන මොහාතේ එහි දුව යන්නට, ඔවුන් හා වචනයක් කතා කරන්නට, ඒ දෙමාපියන්ගේ දෑසට දකින්නට, ඔවුන් අසළ මරණ මංචකය ළඟ රැඳෙන්ට හැකිවෙන්නේ කලාතුරකින් කෙනෙකුට පමණකි. බොහෝ අයට එසේ කළ නොහැකි වෙයි.

අප කාටත් අම්මා කෙනෙකුගේ අඩුව ජීවිතයේ කිසි දිනක පිරවිය නොහැකි අඩුවකි. හිස්බවකි.

මගේ අම්මාට උතුම් වූ නිවන් සුව අත්වේවා !

♦ *ආනන්ද කාරියවසම්*
**Slough Berks UK**